# ශ්‍රී ලංකා රේගුව

# ප්‍රසම්පාදන දැන්වීමයි.

කන්කසන්තුර වරාය මගී පර්යන්තයේ රාජකාරියේ නියුතු රේගු නිලධාරීන් සඳහා නේවාසික පහසුකම් සඳහා පහත පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් වසර දෙක (02) ක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

## ගොඩනැගිල්ල පහත අංගෝපාංගයන්ගෙන් සමන්විත යුතුය.

1. කාමර 6 කින් සමන්විත නේවාසිකාගාර ගොඩනැගිල්ලක් විය යුතුය.
2. කන්කසන්තුර වරාය සිට කි.මී.20 ක් ඇතුලත හෝ ඊට ආසන්නව ප්‍රධාන පාරට මුහුණ ලා නේවාසික ප්‍රදේශයක පිහිටිය යුතුය.
3. ටයිල් ඇතිරූ ගෙබිමක් හා සිවිලිමක් සහිත විය යුතු අතර යාබද වැසිකිලි පහසුකම් සහිත නාන කාමර ටයිල් වලින් සකස් කළ ගොඩනැගිල්ලක් විය යුතුය.
4. කාමර සියල්ලටම සහ ආලින්දයට විදුලි පංකා සහ වායු සමීකරණ පහසුකම් තිබිය යුතුය.
5. ආලින්දයට සෝපාවක් සැපයිය යුතුය.
6. විදුලිබල සහ ජල පහසුකම් සහිත විය යුතුය..
7. ගොඩනැගිල්ල වටා ආරක්ෂිත වැටක් හෝ වට තාප්පයක් සමඟ ගේට්ටු සහිත විය යුතුය.
8. නේවාසිකාගාර ගොඩනැගිල්ලේ එක් එක් කාමරය සඳහා ඇඳන් 02 ක්, රෙදි රාක්ක 02 ක්, කාර්යාල මේසයක් සහ පුටුවක්, අල්මාරියක් සැපයිය යුතුය.
9. නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය සඳහා ශීතකරණයක්, වායු උදුනක් (අවම වශයෙන් දාහකයන් දෙකක්වක් සහිත ) (Gas Cooker), විදුලි ඇඹරුම් යන්ත්‍ර (Blender), ක්ෂුද්‍ර තරංග උදුනක් (Microwave oven), විදුලි කේතලයක්, සම්බන්ධතාවය සහිත රූපවාහිනී යන්ත්‍රයක් (Television with connection) විදුලි උපකරණ සපයා මනා ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගෙන යා යුතුය.
10. අවම වශයෙන් වාහන 02 ක් වත් නවතා තැබිය හැකි කොන්ක්‍රීට් කරන ලද බිමක් තිබිය යුතුය.

## කොන්දේසි

1. මිල ගණන් ඉදිරිපත් කරන භූමිය හා ගොඩනැගිල්ල යම් ආරවුලකට හෝ අධිකරණ ක්‍රියාවලියකට අදාළ වන්නක් නොවිය යුතුය.
2. මිල ගණන් සමඟ පහත ලේඛන සහ තොරතුරු සපයා තිබිය යුතු වේ.
   - I. ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුවේ සහතික කළ පිටපතක්, මිල ගණන් ඉදිරිපත් කරන්නා භූමියේ හා ගොඩනැගිල්ලේ අයිතිකරු නොවේ නම් අතුරුබදු දීමට නීතිමය ප්‍රතිපාදන සහිත බදු ඔප්පුවේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
   - II. භූමියේ සැලැස්ම.
   - III. ගොඩනැගිල්ලේ බිම් සැලැස්ම.
   - IV. ගොඩනැගිලි සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනය විසින් නිකුත් කළ අනුමැතිය.
   - V. ගොඩනැගිල්ල සඳහා පළාත් පාලන ආයතනය විසින් නිකුත් කළ අනුකූලතා සහතිකය.
   - VI. ගොඩනැගිල්ලේ පවතින පහසුකම්.
   - VII. මාසික කුලිය (රුපියල්).
   - VIII. ගෘහ භාණ්ඩ ලයිස්තුව.
   - IX. ආසන්නතම පෙර මාසයේ නිරවුල් කරන ලද පාරිභෝගික බිල්වල පිටපත්.
   - X. වෙනත් (විස්තර කරන්න).
3. ගිවිසුම්ගත කාල සීමාවට අදාළව ජල හා විදුලිය ඇතුලත් පාරිභෝගික බිල්පත් ශ්‍රී ලංකා රේගුව මඟින් නිරවුල් කරනු ඇත.
4. බදුකරු විසින් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු වරිපනම් ආදී බදු හා ගාස්තු දැරිය යුතු වේ.
5. කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 21 ක් ඇතුලත බදු/කුලී ගිවිසුම් සඳහා එළඹීමත් ඊට අදාල වියදම් බදුකරු විසින් දැරිය යුතු වේ.
6. ගිවිසුම් ගත කාළ සීමාව සඳහා ගොඩනැගිල්ලේ සහ රථගාලේ පරිහරණ අයිතිය ශ්‍රී ලංකා රේගුව සතුව පැවතිය යුතු අතර ගොඩනැගිල්ල සහ රථගාල හැර භූමිය බදුකරු විසින් මැනවින් නඩත්තු කර පවත්වා ගෙන යාම බදුකරුගේ වගකීමකි.
7. ගොඩනැගිල්ලේ සියළු අළුත්වැඩියා කටයුතු බදුකරු විසින් ඉටු කළ යුතුය.
8. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් බහා මුද්‍රා තබන ලද කවරයේ වම් පස ඉහල කෙලවරේ කන්කසන්තුර වරාය මගී පර්යන්තයේ රාජකාරියේ නියුතු රේගු නිලධාරීන් සඳහා නේවාසික පහසුකම් සපයා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම ලෙස සඳහන් කළ යුතුය.

9. මුද්‍රා තබන ලද මිල ගණන් **රේගු අධ්‍යක්ෂ, සේවා සැපයීම්, 6 වන මහල, රේගු මන්දිරය, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11** ලිපිනයට 2024.12.10 දින ප.ව.2.00 ට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් යොමු කළ හැකි අතර නොඑසේ නම් රේගු මන්දිරයේ 6 වන මහලේ පිහිටි සේවා සැපයීම් අංශයේ තබා ඇති අදාළ ප්‍රසම්පාදන පෙට්ටියට බහාලිය යුතුය.
10. මිල ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලබන අතර එම අවස්ථාව සඳහා ගොඩනැගිලි අයිතිකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.
11. මිල ගණන් ඉදිරිපත් කළ ගොඩනැගිලි වල යෝග්‍යතාවය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්, අධ්‍යක්ෂ සේවා සැපයීම් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (සේවා සැපයීම්) ස්ථානීය පරීක්ෂාවකින් ද අනතුරුව තීරණය කෙරෙනු ඇත.
12. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.
13. වැඩිදුර තොරතුරු අංක 011-2221680 දුරකථන මාර්ගයෙන් රේගු අධ්‍යක්ෂ (සේවා සැපයීම්) වෙතින් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු (සුළු පරිමාණ) ප්‍රසම්පාදන කමිටුව,
රේගු මූලස්ථානය, අංක 40,
කෙළින් වීදිය, කොළඹ 11.